තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් වන ගාස්තු ව්‍යුහය පිළිබඳ දැන්වීම

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 42 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව, 2017 පෙබරවාරි මස 3 වන දින සිට බලාත්මක වන පරිදි ගාස්තු සම්බන්ධයෙන් වන පහත සඳහන් රීති නියම කර ඇත.

1.0 අයදුම්පත්‍ර ගාස්තු

1.1 තොරතුරු පිළිබඳ ඉල්ලීමක් කරන පුරවැසියෙකු වෙත, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ අයදුම්පත්‍රයක් ලබා දීමේ දී කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.

1.2 තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන් මූලික කටයුතු කිරීම සඳහා කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.

2.0 තොරතුරු සඳහා ගාස්තු (පහත අයිතම 3ට යටත්ව)

2.1 ඡායාපිටපත් සඳහා ගාස්තු

2.1.1 A4 ප්‍රමාණයේ (21 cm × 29.7 cm) සහ ඊට වඩා කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයන ලද තොරතුරු සඳහා, එක් කඩදාසියක එක් පැත්තක් සඳහා රුපියල් 2/- ක් ද දෙපැත්ත සඳහා රුපියල් 4/-ක් ද අය කෙරේ.

2.1.2 Legal ප්‍රමාණයේ (21.59 cm × 35.56 cm) සහ A3 ප්‍රමාණයේ (29.7 cm × 42 cm) කඩදාසියක සපයන ලද තොරතුරු සඳහා, එක් කඩදාසියක එක් පැත්තක් සඳහා රුපියල් 4/-ක් ද දෙපැත්ත සඳහා රුපියල් 8/- ද අය කෙරේ.

2.1.3 ඉහත සඳහන් කරන ලද ප්‍රමාණයන්ට වඩා විශාල කඩදාසියක සපයන ලද තොරතුරක් සඳහා සැබෑ වියදම අය කෙරේ.

2.2 මුද්‍රිත පිටපත් සඳහා ගාස්තු

2.2.1 A4 ප්‍රමාණයේ (21 cm × 29.7 cm) සහ ඊට වඩා කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයන ලද තොරතුරු සඳහා, එක් කඩදාසියක එක් පැත්තක් සඳහා රුපියල් 4/- ක් ද දෙපැත්ත සඳහා රුපියල් 8/-ක් ද අය කෙරේ.

2.2.2 Legal ප්‍රමාණයේ (21.59 cm × 35.56 cm) සහ A3 ප්‍රමාණයේ (29.7 cm × 42 cm) කඩදාසියක සපයන ලද තොරතුරු සඳහා, එක් කඩදාසියක එක් පැත්තක් සඳහා රුපියල් 4/-ක් ද දෙපැත්ත සඳහා රුපියල් 8/-ක් ද අය කෙරේ.

2.2.3 ඉහත සඳහන් කරන ලද ප්‍රමාණයන්ට වඩා විශාල කඩදාසියක සපයන ලද තොරතුරක් සඳහා සැබෑ වියදම අය කෙරේ.

2.3 තොරතුරු ඉල්ලීම කරන පුරවැසියා විසින් සපයන ලද ඩිස්කට්ටුවක් (Diskette), සංයුක්ත තැටියක් (Compact Disc), යූඑස්බී දත්ත පරිවාහකයක් (USB mass drive) හෝ ඊට සමාන ඉලෙක්ට්‍රොනික උපාංගයකට තොරතුරු පිටපත් කරදීම සඳහා මේ එක් එක් අයිතමයක් සඳහා රුපියල් 20/- බැගින් අය කෙරේ.

2.4 පොදු අධිකාරිය වන ලංකා බැංකුව විසින් සපයන ලද ඩිස්කට්ටුවක් (Diskette), සංයුක්ත තැටියක් (Compact Disc), යූඑස්බී දත්ත පරිවාහකයක් (USB mass drive) හෝ ඊට සමාන ඉලෙක්ට්‍රොනික උපාංගයකට තොරතුරු පිටපත් කරදීම සඳහා සැබෑ වියදම අය කෙරේ.

2.5 ඕනෑම ලියවිල්ලක් හෝ විෂයයක් (Material) අධ්‍යයනය කිරීම හෝ පරීක්ෂා කිරීම, හෝ ඉදිකිරීම් ක්ෂේත්‍රයක් පරීක්ෂා කිරීම සඳහා පැයකට රුපියල් 50/-ක් බැගින් අය කෙරෙන අතර, ඒ සඳහා පැයකට වඩා වැඩි කාලයක් ගත වන්නේ නම්, අධ්‍යයනය කිරීමේ හෝ පරීක්ෂා කිරීමේ පළමු පැය සඳහා ගාස්තු අය නොකෙරේ.

2.6 නියැදි (සාම්පල) හෝ ආකෘති (මොඩල) සඳහා සත්‍ය වියදම අය කෙරේ.

2.7 විද්‍යුත් තැපෑල මඟින් සපයනු ලබන තොරතුරු සඳහා ගාස්තු අය කිරීමක් සිදු නොවේ.

3.0 <u>නොමිලයේ සපයනු ලබන තොරතුරු</u>

3.1 පිටු හතරක් (A4 ප්‍රමාණයේ) ප්‍රමාණයේ තොරතුරු අන්තර්ගත හෝ සකසන ලද ඡායා පිටපත් හෝ මුද්‍රිත පිටපත් සඳහා ගාස්තු අය නොකෙරේ.

3.2 සාමාන්‍යයෙන් ගාස්තුවකින් තොරව ලබාදිය හැකි තොරතුරු තවදුරටත් ගාස්තුවකින් තොරව ලබාදීම සිදුවේ.

4.0 <u>ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගාස්තු ගෙවීමේ ක්‍රමය</u>

4.1 'කොමිස් ගිණුම, තොරතුරු දැනගැනීමේ අයිතිය' (Comm. A/C Right to Information) යන ගිණුමට මුදල් ගෙවීම හෝ,

4.2 'කොමිස් ගිණුම, තොරතුරු දැනගැනීමේ අයිතිය' (Comm. A/C Right to Information) යන ගිණුමෙහි නමින් බැංකු අණකරයක්/නිල චෙක්පතක් තැන්පත් කිරීම හෝ,

4.3 'කොමිස් ගිණුම, තොරතුරු දැනගැනීමේ අයිතිය' (Comm. A/C Right to Information) යන ගිණුමෙහි නමින් තැපැල් ඇණවුම තැන්පත් කිරීම කළ යුතුය.

ගාස්තු ගෙවීමේ අකාරය කුමක් වුව ද, ගාස්තුව ගෙවූ පසු රැස් කිරීමේ ශාඛාවේ බලයලත් නිලධාරියා විසින් නිසි ආකාරයෙන් අත්සන් කරන ලද කුවිතාන්සිය තොරතරු ඉල්ලුම්කරු වෙත භාර දිය යුතුය.

-පොදු අධිකාරිය: ලංකා බැංකුව-